"පෙම්වතියගෙන් පෙම්වතාට නැවුම් තෑග්ගක්" යන සිරස්තලයෙන් යුතුව, භාවාතිෂය කතාන්තර කීමේ ශෛලියකින් දිවයින පුවත්පතේ පළවී තිබූ ලිපියකි. බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට පාත්‍ර කිරීමේ සිදුවීමක් මෙහි ලියැවී තිබුණු අතර, එම ලිපිය පිළිබඳ අපගේ නිරීක්ෂණ පහත දැක්වේ.

1) මෙම ලිපිය ලියැවී ඇති භාවාතිශය ආකාරය ඔස්සේ මෙහි ඇති සමාජ ගැටළුව සහ පාඨකයා ග්‍රහණය කරගත යුතු සියුම් තොරතුරු යටපත්ව ගොස් නොමැත්තේද?

2) මෙහි අදාළ වින්දිත බාලවයස්කාරිනියගේ බාහිර ස්වරූපය පුන පුනා දැක්වීම ඔස්සේ ලිපියේ රචකයා බලාපොරොත්තු වන්නේ මෙය භාවාතිශය කතාන්තරයක් බවට පත් කිරීමද?

3) මෙහි "පෙම්වතියගෙන් පෙම්වතාට නැවුම් තෑග්ගක්" යන සිරස්තලය ඔස්සේත්, ලිපිය ඉදිරිපත් කොට ඇති භාවාතිශය, කතාන්තරමය ශෛලිය ඔස්සේත් බාලවයස් අපයෝජනයක් යන වරද සැහැල්ලු කිරීමක් සිදුවී නොතිබෙන්නේද?

මෙම සියලු කරුණු කාරණා සලකා බැලූ විට, මෙය මාධ්‍යකරුවෙකුගේ සමාජ වගකීමෙන් මුළුමනින්ම බැහැර වී ඇති, මාධ්‍ය ආචාර ධාර්මිකත්වය උල්ලංඝනය කරනා ලිපියක් නොවන්නේද?

එසේම දූෂණය වැනි යෙදුම් ඔස්සේ වින්දිතයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන බැවින්, මෙහිදී වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ ලිංගික අපයෝජනය බව කිව යුතු වේ.

මෙම පුවත්පතේම පළවූ මෙවැනිම ලිපියක් සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් මීට පෙරද අපි ඉදිරිපත් කොට ඇත්තෙමු. ඊට ප්‍රවේශය මෙතැනින්:**https://www.facebook.com/ethicseye/posts/1273838249637896**

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina**